᥈ ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2132/5 – 2019 ජූලි 17 වැනි බදාදා – 2019.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොට්ඨාස අංක ජේ/223 විත්තකපුරම් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තෙලිප්පලායි නිරිත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ya/TLL/2018/40 හා 2018.06.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – නීලවත්තෛයි සහ කඩුක්කුම්පලෛයි – **ප්‍රමාණය: හෙක්. 0.0312**

උතුරට: මයිල්වාකනම් තෛවම්බිකායි හිමිකම් කියන නීලවත්තෛයි සහ කඩුක්කුම්පලෛයි වත්ත; නැගෙනහිරට: වයිතීස්වරන් කුනාලන් හිමිකම් කියන නීලවත්තෛයි සහ කඩුක්කුම්පලෛයි වත්ත; දකුණට සහ බටහිරට: පාර (ප්‍රාදේශීය සභා).

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/5/2018/HA/15.
2019 මැයි මස 23 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 976